## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - 2017

-----------------------------------------

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමග සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ **111** වන වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

(අ) ප්‍රමිතයෙහි, 80 ඡේදය ප්‍රකාරව වාර්තාකරන දිනයෙන් පසුව මාස 12 ක් තුළදී නිරවුල් කිරීමට නියමිත නම් ඒවා ජංගම වගකීම් ලෙසත් අනෙකුත් සියළුම වගකීම් ජංගම නොවන වගකීම් ලෙසත් වර්ගීකරණය කළ යුතු වුවත් ඊට පටහැනිව 2017 දෙසැම්බර් 31 දිනට රු.3,202,260 ක් වූ කල්බදු ණයහිමි ශේෂය ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි.

(ආ) 2017 වර්ෂයේ බැඳුම්කර ගිවිසුම් කඩ කිරීම මත ආචාර්යවරයකුගෙන් විශ්වවිද්‍යාලයට අයවියයුතු රු.3,784,401 ක් සම්බන්ධයෙන් ප්‍රමිතයෙහි 127 ඡේදය පරිදි මූල්‍ය ප්‍රකාශනවල සටහන්වල හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබූ රු.346,030 ක සේවා ගාස්තු වලින් රු.288,362 ක් 2017 වර්ෂයට සහ රු.57,668 ක් 2018 වර්ෂයට අදාළ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා රු.57,668 ක් හා 2018 වර්ෂය සඳහා රු.288,362 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා ඉදිරියට කළ ගෙවීම් රු.230,694 කින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබූ ක්ෂය වටිනාකම රු.393,915,972 ක් වුවද විගණනයේ ගණනය කිරීම් අනුව එම වටිනාකම රු.389,488,843ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.4,427,129 ක් වැඩියෙන්ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ වල ශුද්ධ අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශිෂ්‍යාධාර, මහපොළ දීමනා හා වේතන එකතුව රු.18,145,775ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ ගිණුම් ගත කිරීම වෙනුවට ප්‍රාග්ධන අරමුදල් යටතේ වෙනත් ගෙවිය යුතු වියදම් ලෙස දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී පැරණි තොග විකිණීමෙන් ලැබී තිබුණු රු.1,027,954 ක ආදායම තුළ ස්ථාවර වත්කම් අබලි ද්‍රව්‍ය අලෙවි කිරීමෙන් ලැබී තිබුණු රු.365,500 ක ආදායමක්ද ඇතුළත්ව තිබූ අතර එම වත්කම්වලට අදාළ පිරිවැය හා ඒවායේ සමුච්චිත ක්ෂය හඳුනාගෙන අදාළ වත්කම් ගිණුම් වලින් හා ක්ෂය වෙන් කිරීමේ ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උපචිත වියදම් ලෙස රු.63,748,316 ක් (පීඨ උපචිත වියදම් හැර) දක්වා තිබුණද, විගණනයේ ගණනය කිරීම් අනුව උපචිත වියදම රු.66,521,696 ක් වන බැවින්, සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් හා වර්ෂයේ ඌනතාවය රු.2,773,380 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(i)** ආයෝජන ක්‍රියාකාරකම්වල මුදල් ගලා යෑම් යටතේ දේපල පිරියත හා උපකරණ අත්පත් කරගැනීම් ලෙස රු.1,070,521,983ක් දක්වා තිබුණද එයට මුදල් ප්‍රවාහයක් නොවන පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.3,422,115 ක් වටිනා වත්කම්ද, සමාලෝචිත වර්ෂයේ මුදල් ගෙවා නොතිබුණද ලැබී තිබුණු උපකරණ වටිනාකම හා මිලදී ගත් උපකරණ සඳහා රඳවාගත් එකතුව රු.44,133,742 ක මුදලක් ඇතුළත්ව තිබුණු බැවින් ආයෝජන ක්‍රියාකාරකම් වල ශුද්ධ මුදල් ප්‍රවාහය රු.47,555,857 ක් වැඩියෙන් දැක්වුණි.

**(ii)** සමාලෝචිත වර්ෂයේදී පර්යේෂණ හා අනෙකුත් අරමුදල් වල මුදල් ගලා ඒම රු.48,232,282ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.33,316,246 ක් ලෙස දැක්වීමෙන් මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය රු.14,916,036 ක් අඩුවෙන් දැක්වුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ මහපොළ භාර අරමුදලින් ලද මුදල්, ආදායම් යටතේ දැක්වීමේදී රු.3,169,650 ක් ආපසු අරමුදල වෙත යවන ලද නමුත් එම ප්‍රමාණය අඩුකර නොදැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම හා මහපොළ ගෙවීම් වලට අදාළ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තොග සත්‍යාපන වාර්තා අනුව විශ්වවිද්‍යාලයේ මධ්‍යම ගබඩාවේ හා තවත් උප ගබඩා 06 ක 2017 දෙසැම්බර් 31 දිනට තොග ශේෂ එකතුව රු.27,006,122 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම ශේෂයන්හි එකතුව රු.26,729,978 ක් ලෙස දැක්වීමෙන් රු.276,144 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ආදායම් ප්‍රකාශනයේ පුනරාවර්තන වැය විෂයයන් 04 ක දැක්වෙන වියදම හා ඊට අදාළ උප ලේඛනවල දැක්වෙන වියදම අතර රු 8,493,870 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු 04 ක ශේෂ සනාථ කිරීම් ලිපි අනුව ශේෂයන් සහ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂයන් අතර රු.71,228 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ ඇති විවිධ තැන්පත් ශේෂය රු.7,509,780 ක් වුවත්, ලෙජර් ගිණුම් අනුව එම ශේෂය රු.7,357,688 ක් වූයෙන් රු.152,092 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(අ) නිල වාහන වෙන් කරන ලද නිලධාරින් 08 දෙනෙකු විසින් අනුමත සීමාව ඉක්මවා විශේෂ අවස්ථාවල ධාවනය කිරීම වෙනුවෙන් වටිනාකම රු.809,707 ක් වූ ඉන්ධන ලීටර් 8,045 ක් ලබාගෙන තිබූ අතර, අමතර ඉන්ධන භාවිතා කර ගමන් කළ රාජකාරි වලට අදාළ ලිඛිත සාක්ෂි කිසිවක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල විශ්වවිද්‍යාලය සතු සංචිත වාහන 3 ක් දිස්ත්‍රික්කයෙන් පිටත ගමන් සඳහා යොදවා තිබූ අතර, ඉන් අවස්ථා 51 ක දී කිලෝමීටර් 21,678 ක් ධාවනය සඳහා ඉන්ධන වෙනුවෙන් රු.195,193 ක් වැයකර තිබුණි. එම ගමන් වලට අදාළ රාජකාරිය කුමක්ද යන්න තහවුරු කරගැනීමට අවශ්‍ය සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවූ අතර ඉන් අවස්ථා 29 ක ධාවනයකර තිබූ කිලෝ මීටර් 12,267 ක් වෙනුවෙන් ලියා තිබූ ධාවන සටහන් කිසිදු නිලධාරියෙකු විසින් අත්සන්කර නොතිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 94 වගන්තිය | කවර ප්‍රභවයකින් වුවද විශ්වවිද්‍යාලය වෙත ලැබෙන මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැර කළ යුතු වුවද 2013 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දක්වා වෛද්‍ය පීඨයේ ලියාපදිංචි වූ විදේශ සිසුන්ගෙන් අය කර තිබූ පාඨමාලා ගාස්තු හා නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ පොලිය ලෙස ලැබී තිබුණු එකතුව රු.54,405,194 ක් විශ්වවිද්‍යාල අරමුදලට බැර නොකර වෛද්‍ය පීඨ අරමුදලට බැර කර තිබූ අතර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විදේශ ගමන් සඳහා භාවිතා කර තිබුණි. |
| (ආ) 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතින් සංශෝධිත 1978 අංක 94 දරන පනතේ 8 ඒ (i) සහ (ii) වගන්ති | සමාලෝචිත වර්ෂය තුල විශ්වවිද්‍යාලය විසින් සිදුකර තිබූ ඉදිකිරීම් 05 ක් සඳහා අදාළ පළාත් පාලන ආයතනයන්ගෙන් සැලසුම් අනුමත කර ගැනීම හා සංවර්ධන බලපත්‍රය ලබාගැනීම සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ හා ඊට පෙර වර්ෂවල ඉදිකිරීම් නිම කරන ලද කිසිදු ගොඩනැගිල්ලක් සඳහා අනුකූලතා සහතික ලබාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>------------------------------ | |
| (i) මුදල් රෙගුලාසි 134 (3) | ආයතනයේ අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 (2) | 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලයට අදාළ ආපන ශාලා තැන්පත් රු.256,500 ක්ද කොන්ත්‍රාත් තැන්පත් රු.1,079,207 ක්ද සහ වර්ෂ 2 සිට වර්ෂ 13 දක්වා කාලපරාසයක් තුල ගිණුම් වල රඳවා තිබෙන රු.22,731,064 ක් වූ කොන්ත්‍රාත් රැඳවුම් මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | විශේෂ කාර්යයන් සඳහා එක් වරකට නිලධාරියෙකුට ලබාදිය හැකි උපරිම අත්තිකාරම් මුදල රු.100,000 ක් වුවද, එම සීමාව ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 20 කදී රු.125,000 සිට රු.363,300 ක් දක්වා රු.3,591,240 ක අත්තිකාරම් ලබාදී තිබූ අතර, ඒ සඳහා චක්‍රලේඛ විධිවිධාන අනුව අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ<br>------------------------------ | |
| (i) 2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 දරන ආයතන චක්‍රලේඛයේ 4 ඡේදය | නිල වාහන හිමිකාරිත්වය දරන නිලධාරියෙකුට පැවරී ඇති රාජකාරි සඳහා මාසික ඉන්ධන සීමාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවලදී උපකුලපති සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සභාපතිගෙන්ද අනෙකුත් නිලධාරින් සඳහා පාලන අධිකාරියෙන්ද අනුමැතිය ලබා ගැනීමෙන් පසු අදාල නිලධාරියා විසින් අමතර ඉන්ධන සඳහා වියදම් දරා, අතිරේක ඉන්ධන භාවිතය මත පදනම්ව දරන ලද ඉන්ධන වියදම ප්‍රතිපූරණය කර ගත යුතු වුවද, ඒ අනුව කටයුතු නොකර සමාලෝචිත වර්ෂය තුල අනුමත සීමාව නොසලකා නිලධාරින් 08 දෙනෙකු වෙත අමතර ඉන්ධන ලීටර් 8,045 ක් ඉන්ධන ඇණවුම් මගින් නිකුත් කර තිබුණි. |
| (ii) 2012 අප්‍රේල් 23 දිනැති අංක 981 දරන චක්‍රලේඛය | උපාධි අපේක්ෂකයින් වෙනුවෙන් සමාසික නිබන්ධන සකස් කිරීම සඳහා එක් නිබන්ධනයකට අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙත රු.600 බැගින් ගෙවියයුතු අතර, එක් නිබන්ධනයක් සකස් කිරීම සඳහා එක් සාමාජිකයෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් සහභාගි වන අවස්ථාවලදී එම මුදල සමානුපාතිකව බෙදා ගෙවියහැකි වුවද, සහභාගි වන සියලු දෙනා වෙනුවෙන් රු.600 බැගින් සමාලෝචිත වර්ෂය තුළ රු.384,560 ක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | 2012 අප්‍රේල් 30 දිනැති අංක 982 දරන චක්‍රලේඛය | බඳවා ගැනීම් හා උසස් කිරීම් සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණවලට සහභාගි වන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක එක් එක් සාමාජිකයා සඳහා අවමය රු.1,000 කට යටත්ව සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින එක් අපේක්ෂකයෙකු වෙනුවෙන් රු.50 බැගින් ගෙවිය යුතු වුවත්, චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවන ලෙස සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටින එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් රු.1,000 බැගින් අවස්ථා 15 කදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්ට රු.185,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.82,650,092 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.115,086,984 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.197,737,076 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. කාර්ය මණ්ඩල පිරිවැය රු. 92,375,965 කින් වැඩිවීම හා රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.54,825,000 කින් අඩුවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ පැවති ඌනතාවය 2014 වර්ෂයේ අතිරික්තයක් බවට පත්වී තිබුණද 2015 වර්ෂයේ නැවත ඌනතාවයක් බවටද 2016 වර්ෂයේ නැවත අතිරික්තයක් බවටද පත්වී සමාලෝචිත වර්ෂයේ නැවත ඌනතාවයක් බවට පත් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු.654,773,984 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,261,528,920ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යසාධනය ඇගයීම සඳහා 2016 අගෝස්තු 18 දින සනාථන සභාව විසින් නිර්දේශකර 2016 නොවැම්බර් 01 දින විශ්වවිද්‍යාල පාලක මණ්ඩලය අනුමත කර තිබූ විශ්වවිද්‍යාලයේ "අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැඩ ධාරිතාවය ගණනය කිරීම සඳහා වූ මෙහෙයුම් ප්‍රතිපත්ති හා ක්‍රියා පිළිවෙත්" **(Operating policy and procedure for Calculation of workload of Academic Staff)** නමින් වූ මාර්ගෝපදේශ මාලාව 2018 අගෝස්තු 30 දින වන විටත් විශ්වවිද්‍යාලය තුල ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් සේවා දිගුවක් ලබා නොදීමට ගන්නා ලද තීරණය නීතිය ඉක්මවා කටයුතු කිරීමක් ලෙස අනුරාධපුර කම්කරු විනිශ්චයාධිකරණය විසින් නිගමනය කරමින් දී තිබූ නියෝගය හේතුවෙන් සේවා දිගුව නොලැබූ විශ්වවිද්‍යාල සේවකයෙකු වෙත රු.162,609 ක වන්දියක් විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව විශ්වවිද්‍යාලය වෙත ලැබෙන විගණන විමසුම් පිළිබඳ අප්‍රමාදව ක්‍රියාකර ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර ඇතුළත් සම්පූර්ණ පිලිතුරු වහාම සැපයීම ගණන්දීමේ නිලධාරින්ගේ වගකීම වුවත් සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ නිකුත් කර තිබූ විගණන විමසුම් 20 ක් අතුරින් විමසුම් 3 ක් සඳහා 2018 ඔක්තෝබර් 12 දක්වා පිළිතුරු ලැබී නොතිබුණි. තවද, විගණන විමසුම් 17 කට පිළිතුරු සැපයීම සඳහා පිළිතුරු අපේක්ෂිත දිනයේ සිට මාස 01 ත් මාස 09 ත් දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ වර්ෂ 5 වෙනුවෙන් 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති විසින් නිකුත් කර තිබූ කළමනාකරණ විගණන වාර්තාවන් පාලක සභාවේ අවධානයට යොමු කර නොතිබුණු අතර, ඒ සම්බන්ධයෙන් පනතේ 13(8) වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-------------------------------

වෛද්‍ය හා සමාන්තර විද්‍යාපීඨයේ මහාචාර්ය ඒකකය පිහිටි ගොඩනැගිල්ල ඉදිකිරීමේ පළමු අදියර සඳහා අනුමත මුදල රු.මිලියන 673 ක් වුවද 2011 වර්ෂයේ එම අදියරේ වැඩ අවසන් වන විට මුළු වැඩවල වටිනාකම රු.මිලියන 814.19 ක් වී තිබුණි. කෙසේ වුවද, එහි අධි වැය රු.මිලියන 141 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී හෝ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

## 4.4 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත ප්‍රකාරව එම අරමුදල වෙත යැවිය යුතු අර්ධ වාර්ෂික වාර්තා නියමිත දිනට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් අධිභාර වශයෙන් රු.489,295 ක මුදලක් අරමුදල වෙත ගෙවා තිබූ අතර, එම වාර්තා ප්‍රමාද කර යැවීමට කටයුතු කළ නිළධාරීන් පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් විශ්වවිද්‍යාලය විසින් ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලය විසින් ශිෂ්‍යා නේවාසිකාගාර පවත්වා ගෙන යාමට කුලී පදනම මත ලබාගත් නිවෙස්වල ජලබිල්පත් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් රු.45,075 ක ප්‍රමාද ගාස්තුවක් හා විසන්ධි කර තිබුණු ජල සැපයුම නැවත ලබා ගැනීම සඳහා සම්බන්ධ කිරීමේ ගාස්තු ලෙස රු.10,350 ක් ගෙවා තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළයුතු අතර සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය විසින්, තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එකී කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා වීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනා ගෙන නොතිබුණි.

තවද තිරසාර සංවර්ධන ඉලක්කවලට ළඟාවීමට අදාළව විශ්වවිද්‍යාලයේ සූදානම පිළිබඳ ඇගයීම සඳහා විගණකාධිපති විසින් ඉදිරිපත් කර තිබූ ප්‍රශ්නාවලියට විශ්වවිද්‍යාලය විසින් ප්‍රතිචාර දක්වා නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**6.1 අභ්‍යන්තර විගණනය**

මුදල් රෙගුලාසි 133 හා 134 හි සඳහන් විධිවිධානවලට සංයෝජිතව කියවිය යුතු මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණනයේ කාර්යසාධනය කෙසේද යන්න පරීක්ෂා කිරීම සඳහා 2018 මැයි 11 දිනැති අංක එන්සීපී/ඒපී/ඊ/ආර්යූඑස්එල්/2018/05/13 දරන ලිපිය මඟින් අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය සාධනය පිළිබඳ තොරතුරු ඉල්ලා සිටි නමුත්, එම තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් අභ්‍යන්තර විගණනයේ ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොහැකි විය.

**6.2 විගණන කමිටු**

සමාලෝචිත වර්ෂයේ පැවති විගණන කමිටුවල තීරණ හා නිර්දේශ පාලක මණ්ඩලයේ අවධානයට යොමුකර නොතිබුණි.

**6.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

**6.3.1 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ආපන ශාලාවට මුළුතැන්ගෙයක් ඉදිකිරීම සඳහා ගිවිසුම්ගත වටිනාකම රු.2,668,999 කට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. ඉන්ජිනේරු ඇස්තමේන්තුවෙහි සඳහන් වැඩ විෂයයන් 10 ක් සඳහා රු.258,800 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද සවිකර තිබුණ ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපාංග පිරිවිතරවලට අනුකූල නොවන බව නිරීක්ෂණය විය.

(ආ) වටිනාකම රු.15,069,440 ක් වූ වානේ තට්ටු ඇඳන් 610 ක් මිලදී ගැනීම සඳහා සකස් කරන ලද ලංසු ලියවිලිවල ඇතුළත් පිරිවිතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් විධිමත්ව අනුමත කර නොතිබුණු අතර, විශ්වවිද්‍යාලයට මිලදී ගැනීමට අවශ්‍යව තිබූ ඇඳෙහි දිග 1875mm හා පළල 825mm ක් වුවද, සකස් කරන ලද ලංසු ලියකියවිලි වල පළල 825mm හා පළල 975mm ලෙස පිරිවිතර දෙයාකාරයකට ඉදිරිපත්කර තිබුණි. ඒ අනුව ප්‍රමාණ දෙකක් සඳහා ලංසුකරුවන් ඉදිරිපත් කර තිබුණු මිල ගණන් රු.19,500 සිට රු.62,000 දක්වා වූ පරාසයක පැවතුණි. එම ලංසු ඇගයීමේදී ඉහළ මිල ගණන් ඉදිරිපත් කර තිබුණු සියලු ලංසු බැහැර කර අවම මිල ගණන් 3 ක් පමණක් ඇගයීමට ලක්කර තිබූ අතර එම මිල ගණන් 3 අතුරින්ද ඉල්ලා තිබූ පිරිවිතරවලින් සුදුසුකම් ලත් ලංසුව ප්‍රතික්ෂේප කර ඊට ඉහළ මිලකට ඇඳන් මිලදී ගැනීම හේතුවෙන් විශ්වවිද්‍යාල අරමුදලට රු.504,378 ක අලාභයක් සිදුවී තිබුණි.

(ඇ) භාණ්ඩ, සේවා හා වැඩ ලබාගැනීමේදී 2006 රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය. ඊට පටහැනිව වෛද්‍ය පීඨයේ ආචාර්යවරයකු විසින් තම විදේශ සංචාරයකදී ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 2,998 ක් ගෙවා මිලදී ගෙන තිබුණු කැමරාවක් ආපසු පැමිණීමෙන් පසුව විශ්වවිද්‍යාලයට භාරදී තිබූ අතර ඒ වෙනුවෙන් රු.456,745 ක් වෛද්‍ය පීඨ අරමුදලින් ප්‍රතිපූරණය කර තිබුණි.

### 6.3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

---------------------------------------

ද්විත්ව සේවක නිල නිවාස 04 ක් ඉදිකිරීම ගිවිසුම්ගත වටිනාකම රු.52,703,236 ක් වූ කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. තෝරාගත් ලංසුකරුගේ මූලික සුදුසුකම් වල පැවති අඩුපාඩු හේතුවෙන් සවලීකරණ අත්තිකාරම් ගෙවීමේදී වැඩබිමේ ස්ථාපිත වීමෙන් පසු සියයට 10 ක් හා ඉටු කරන ලද වැඩ වල වටිනාකම සියයට 20 ක් ඉක්මවූ පසු ඉතිරි සියයට 10 ක අත්තිකාරම් ලබා දෙන ලෙස තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබියදී එය නොසලකා ගිවිසුම් ගත වටිනාකමෙන් සියයට 20 ක් වූ රු.10,540,647 ක් එකවර අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව මෙම ඉදිකිරීම් 2017 ජූලි 05 දින අවසන් කළයුතුව තිබුණද 2018 අගෝස්තු 05 දින වන විට කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු අතරමග නතර කර කොන්ත්‍රාත්තුව අත්හැර දමා තිබුණි.

### 6.3.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය පිහිටුවීමට රු.මිලියන 143.3 ක වියදමින් සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2017 අගෝස්තු 24 දින ගිවිසුම්ගතව කොන්ත්‍රාත්කරු වෙත 2017 සැප්තැම්බර් 18 දින රු.16,449,500 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව මෙහි ඉදිකිරීම් 2018 දෙසැම්බර් 16 දිනට අවසන් විය යුතුව තිබුණද 2018 සැප්තැම්බර් 30 දින වන විටත් කොන්ත්‍රාත්තුවේ වැඩ ආරම්භ කර නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 පරිච්ඡේදය ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කිරීමට පෙර ප්‍රසම්පාදනයට අවශ්‍ය මූලික සූදානම්වීමේ කටයුතු ඇතුළත් සක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීමත් ගොඩනැගිලි ඉදිකිරීමට අවශ්‍ය හරිත තත්ත්වය මැන බැලීමේ සහතිකය නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් ලබා නොගැනීමත් හේතුවෙන් ඉදිකිරීම ආරම්භ කිරීමට නොහැකිව තිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් වර්ෂයකට අධික කාලයක් අත්තිකාරම් මුදල් අතරඳවාගෙන තිබුණි. කෙසේ වුවද විශ්වවිද්‍යාලය විසින් මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන තිබූ බව තහවුරු නොවුණි.

(ආ) ව්‍යවහාරික විද්‍යාපීඨයේ භෞතික විද්‍යාගාරය සඳහා අවශ්‍ය ලීබඩු ලබාදෙන ලෙස 2016 සැප්තැම්බර් 06 දින පීඨාධිපති විසින් සිදුකර තිබූ ඉල්ලීම අනුව අදාළ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබූ නමුත්, ප්‍රසම්පාදන තීරණ ගැනීමේ දුර්වලතා හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා වර්ෂයක කාලයක් ඉක්මවා තිබුණද අදාළ සැපයුම් සිදු කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

2018 මාර්තු 21 සහ 2018 අප්‍රේල් 03 දිනයන්හි පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දුන් නියෝග ක්‍රියාත්මක කිරීම සතුටුදායක මට්ටමක නොපැවැතුණි. විස්තර පහත දැක්වේ.

| | සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු | | කාරක සභාව සමග එකග වූ කරුණු හා කාරක සභා නිර්දේශ | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | තරඟකාරී මිල ගණන් ලබා ගැනීමකින් තොරව නේවාසිකාගාර සඳහා බවුසර් මඟින් ජලය සැපයීමේදී මූල්‍ය අලාභයක් සිදු වීම, විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයකු සැපයුම්කරුවකු ලෙස ක්‍රියා කිරීම. | i. | ජලය ලබා ගැනීම සඳහා විශ්ව විද්‍යාලය විසින් අනුගමනය කල ක්‍රියාවලිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් කර මසක් ඇතුළත පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට වාර්තා කිරීම. | මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කර තිබූ නමුත් එම පරීක්ෂණ වාර්තාවේ නිර්දේශය 2018 අගෝස්තු 15 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| | | ii. | ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු ශක්තිමත් නොමැති වීම නිසා මෙවැනි අඩුපාඩු සිදු වූ බැවින්, අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වීම සම්බන්ධයෙන් සොයා බලා විසඳුම් ලබා දීමට විශේෂයෙන් කටයුතු කිරීම. | අභ්‍යන්තර විගණක තනතුර සඳහා අනුමත කරගෙන බඳවා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) | උපකුලපති නිල නිවස වටා තාප්පයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාලව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිරිපත් කළ ඉංජිනේරු ඇස්තමේන්තුව සාවද්‍ය ලෙස වෙනස් කර අවම ලංසුකරු ප්‍රතික්ෂේප කර වැඩි මිල ලංසුකරුට කොන්ත්‍රාත්තුව පැවරීම. | | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ලබාදුන් ඇස්තමේන්තුව වෙනස් කිරීමේ අවශ්‍යතාවයක් පැවතියේ ද, වෙනස් කිරීම නිසා වූ බලපෑම හා මෙවැනි වැරදි යලි ඇති නොවීමට යාන්ත්‍රනයක් සැකසීම පිළිබඳ කාරක සභාවට වාර්ථා කිරීම | කාරක සභාවේ නියෝග පරිදි කටයුතු කළ බවට සාක්ෂි නොතිබුණි. |

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- | --- |
| (i) | ගිණුම්කරණය | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන්, ලෙජර් ගිණුම් අගයන් හා උපයෝගී ලේඛන අතර නොසැසඳීම් පැවතිම. මූලධන වත්කම් බැහැර කිරීමේදී විධිමත් ගිණුම්කරණයට අනුව එම ශේෂ පොත්වලින් ඉවත් නොකිරීම. |
| **(ii)** | කොන්ත්‍රාත් පරිපාලනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු නොකළ අවස්ථා පැවතීම. |
| **(iii)** | තොග පාලනය | තොග අගය කිරීමේදී භෞතික ශේෂ හා පොත් අගයන් අතර නොගැලපීම් සැසඳීම් කර හඳුනා නොගැනීම. |
| **(iv)** | වාහන පාලනය | සංචිත වාහන වෙන් කිරීමේදී රාජකාරී අවශ්‍යතා හඳුනාගෙන වාහන වෙන් නොකිරීම හා අනුයුක්ත නිල වාහන සඳහා සීමා ඉක්මවා ඉන්ධන ලබාදීම. |
| **(v)** | පුස්තකාල පරිපාලනය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් විසින් පුස්තකාලයෙන් ලබාගෙන තිබූ පොත් ආපසු භාරදීමේදී මාස 3 සිට අවුරුදු 2 දක්වා වූ කාලප්‍රමාදයන් පැවතීම. |